සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

නම/විභාග අංකය :- ......................................................... කාලය: පැය 02යි.

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) මන්ද්‍ර මධ්‍ය උච්ච යන සප්තක තුනටම අයත් ස්වර පිළිවෙළින් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) නි රි් ස (2) ග ප̣ සං
(3) ප̣ ම රි් (4) සං ප ධ̣

(02) ස්වර සප්තකයට අයත් ප්‍රකෘති හා විකෘති ස්වර සංඛ්‍යාව කොපමණ ද?
(1) ප්‍රකෘති ස්වර 8 යි විකෘති ස්වර 4 යි (2) ප්‍රකෘති ස්වර 7 යි විකෘති ස්වර 5 යි
(3) ප්‍රකෘති ස්වර 6 යි විකෘති ස්වර 6 යි (4) ප්‍රකෘති ස්වර 5 යි විකෘති ස්වර 7 යි

(03) සරිගම, රිගමප, ගමපධ ආදි වශයෙන් යෙදෙන ස්වර අභ්‍යාස ඇතුළත් ස්වර ස්ථාපන ගීතය වන්නේ,
(1) බැතිනා සිරිපා කරුණා කරනා (2) ඇත ඇදී යළි මැතට පාවේ.
(3) කඳු කඳු නැගෙනා වෙරළෙහි හැපෙනා (4) මුණි සිරිපා පාදේ සමනල මුදුනේ

(04) විදුලි ඕගනයක ගීතයක් වාදනයේ දී තාලයේ ලය නැතහොත් වේගය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරනු ලබන ස්විචය නම් කරනු ලබන්නේ,
(1) Tempo (2) Style
(3) Voice (4) Tone

(05) තාලම්පටින් නිකුත්වන තෙයි යන ධ්වනිය හඳුන්වන සංකේතය වන්නේ,
(1) ^ (2) / (3) 0 (4) x

(06) තාලයේ කුඩාම ඒකකය වන්නේ,
(1) ආවර්ථය යි (2) විභාගය යි (3) මාත්‍රාව යි (4) යෙකාව යි

(07) තීව්‍ර මධ්‍යමය (ම´) හැඳින්වීම සඳහා බටහිර සංගීතයේ දී භාවිතා කරනු ලබන සංකේතය වන්නේ,
(1) $F^{\#}$ (2) $F^{b}$ (3) $F^{\natural}$ (4) $G^{\#}$

(08) 'දකුණ නැගෙනහිර බටහිර උතුරද යන දේශාභිමානී ගිතය ගයන ගායකයා වන්නේ,
(1) ආනන්ද සමරකෝන් මහතා (2) W.D.අමරදේව මහතා
(3) සුනිල් එදිරිසිංහ මහතා (4) සුනිල් ශාන්ත මහතා

(09) නූර්ති නිෂ්පාදකවරයෙකු නොවන්නේ,

(1) සී දොන් බස්තියන් මහතා (2) නීතිඥ ජෝන් ද සිල්වා මහතා

(3) නීතිඥ චාල්ස් ඩයස් මහතා (4) දයානන්ද ගුණවර්ධන මහතා

(10) ''සසරිරි| ගුරිස- | රිරිමම | ප---'' මෙම ස්වර පාදයට අයත් ගීත පාදය තෝරන්න.

(1) පොත පත කියවා නුවණ ලබා (2) සිරි සාර අති ශාන්ත

(3) පුංචි තාරකා (4) හෝ හෝ ගා රැල්ල බිඳෙනවා

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(11) '' දම්වැසි වස්සන ලෝකේ......'' යන ගීතය ................................................ නූර්තියට අයත් වේ. (විදුර/ රාමායණය)

(12) ................................................. මෙය උපදේශාත්මක ගීතයකි ( කටු අකුලේ මල් ඇහැරේ/ පාන් කිරිත්තා)

(13) ''ගම්භීර කාලිංග නුවර.....'' යන, කෝලම් නාට්‍යයේ එන ගීතය ගයමින් රඟ දක්වනු ලබන්නේ...................................... විසිනි. (සබේ විදානේ/ ජසයා)

(14) ..................................................... යන ගීතය විෂම ග්‍රහයෙන් ගැයෙන ගීතයකි. (අම්මා සඳකි / හෙළ ජාතික අභිමානේ)

(15) ''උඩු නියරෙන් වැටි ගෙනේ'' මෙම ගී පාදය .......................................... වලට අයත් වේ. (ගොයම් ගී/ නැළවිලි ගී)

- පහත සඳහන් A කොටසට අදාළ පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| A කොටස | B කොටස |
|---|---|
| (16) දූල් ගීතයකි. | දුර පෙනෙන තැනි තලා |
| (17) රබන් වයමින් ගයයි. | නොමග නොයන් පුතේ |
| (18) විෂමග්‍රහයෙන් ගැයේ | සිරිසාර අතිශාන්ත |
| (19) උපදේශාත්මක ගීයකි | සන්තානම් පල්ලි යන්න |
| (20) කෝමළ ග නි යෙදේ. | උරතල කැල ඔඩිය ලෙන්ද |

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- ඉතිරි ප්‍රශ්න වලින් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01) 1) ස්වර සප්තකයේ ඇති කෝමල ස්වර සංඛ්‍යාව කොපමණ ද?
2) සප්තකයේ ඇති විකෘති ස්වර ලියා දක්වන්න.
3) දාදරා තාලයේ ඨේකාව ප්‍රස්තාර කරන්න.
4) ඉහත තාලයට ගැයෙන ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.

(02) 1) ශ්‍රී ලංකාවේ පහත රටට ආවේණික නාට්‍ය සම්ප්‍රදාය නම් කරන්න.
2) එම නාට්‍ය පිළිබඳ කරුණු තුනක් ලියා දක්වන්න.
3) රබන් ගී හෝ දරු නැළවිලි ගී පිළිබඳ කරුණු තුනක් ලියන්න.
4) ඉහත (3) කොටසකට තෝරා නොගත් ගීත වර්ගයට අයත් ගීතයක් ලියා දක්වන්න.

(03) 1) ළමා ගීත රචකයන් දෙදෙනෙකු නම් කරන්න.
2) ඔබ කැමති ළමා ගීත හතරක් නිර්මාණය සඳහා යොදා ගත් තේමා නම් කරන්න.
3) ඉන් එක් ළමා ගීතයක් ලියන්න.
4) පහත සඳහන් වචන යොදා ගනිමින් ගීතයකට සුදුසු පද මාලාවක් නිර්මාණය කරන්න.
ටිකිරි, මිහිරි, නටමු, ගයමු, වයමු, සිනා, ගීත, පාලා, දැන්, තුටින්, ගී, නිවාඩු කාලේ

(04) a) යහපත් ආකල්ප වර්ධනය වේ.
b) වීරත්වය අභිමානය උද්දීපනය වේ.
1) ඉහත කරුණු වලින් අදහස් වන ගීත වර්ග 2 නම් කරන්න.
2) එම ගීත වර්ග වලට අයත් ගීත දෙක බැගින් නම් කර එම ගීත ගයන ගායක ගායිකාවන් ද නම් කරන්න.
3) ඉහත එක් ගීත වර්ගයකට අයත් ගීතයක පළමු කොටස ලියා දක්වන්න.
4) ඔබ උගත් නූර්ති ගීතයක පළමු කොටසෙහි පද ප්‍රස්තාර කරන්න.